**දකුණු පළාත් සභාව**
தென் மாகாண சபை
**SOUTHERN PROVINCIAL COUNCIL**

**අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය**
கல்வி, காணி மற்றும் காணி அபிவிருத்தி, லைகவ் மற்றும் தகவல்நெடுஞ்சா துறை அமைச்சு
**Ministry of Education, Land & Land Development, Highways & Information**

**බිම් මහල, "දක්ෂිණ පාය", ලබුදූව, ගාල්ල.** கீழ் மாடி, "தக்சிண பாய", லபுகுவ, காலி, Ground Floor, "Dakshina Paya", Labuduwa, Galle.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | SP/EDUMIN/AD/18/25 | ඔබේ අංකය<br>உனது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2025.06. 17 |

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,

කලාප අධ්‍යාපන කාර්යාලය,

ගාල්ල/අම්බලන්ගොඩ/ඇල්පිටිය/උඩුගම/මාතර/අකුරැස්ස/මුලටියන/දෙනියාය/හම්බන්තොට/
වලස්මුල්ල/තංගල්ල

**<u>වාර්ෂික ස්ථාන මාරු - 2025</u>**

**<u>අනධ්‍යන සේවක සේවය - දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව</u>**

උක්ත කරුණ සම්බන්ධ මගේ අංක 01/2025 දරණ අනධ්‍යයන සේවක සේවයේ වාර්ෂික ස්ථාන මාරු අභ්‍යන්තර චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02.ඒ අනුව උක්ත සේවාවන්හි සේවයේ නියුතු සේවක මහත්ම මහත්මීන් සම්බන්ධයෙන් 2025 වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලයේ නිර්දේශ ප්‍රකාරව සකස් කරන ලද මාරු මණ්ඩල තීරණ අමාත්‍යංශයීය වෙබ් අඩවියට (edumin.sp.gov.lk) යොමු කර ඇති අතර එම ස්ථාන මාරුවීම් 2025.07.21 දින සිට ක්‍රියාත්මක කරන ලෙස මෙයින් නියෝග කරමි.

03. ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වන දින වන විට ප්‍රසූත නිවාඩු ලබා ඇති නිලධාරිනියන්ගේ ස්ථාන මාරුවීම් ප්‍රසූත නිවාඩු අවසන්ව සේවයට වාර්තා කළ දිනට සතියකට පසු ක්‍රියාත්මක කළ යුතුය.

04. තවද, මෙම ස්ථාන මාරුවීම් නියෝග පිළිබඳව අදාළ සේවක මහත්ම මහත්මීන්ට කල් ඇතිව දැනුම් දී නියමිත දිනයේදි නව සේවා ස්ථානයෙහි රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි ඔවුන් සේවයෙන් නිදහස් කිරීමට කටයුතු කළ යුතු අතර , නියමිත දිනයේදි නව සේවා ස්ථානයට වාර්තා නොකරන සේවක මහත්ම මහත්මීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බවට ද අදාළ සේවක මහත්ම මහත්මීන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

05. මෙම ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් කිසියම් සේවක මහත්මියක හෝ මහත්මියක හෝ අභියාචනා ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ නම්, අංක 01/2025 දරණ අභ්‍යන්තර චක්‍රලේඛයෙහි ආකෘති අංක 03 ප්‍රකාරව අභියාචනා අයදුම්පත්‍රය නිසි පරිදි සම්පූර්ණ කර 2025.06.26 දිනට ප්‍රථම කලාප අධ්‍යාපන කාර්යාලය වෙත හා කලාප අධ්‍යාපන කාර්යාලය මඟින් 2025.07.01 දිනට ප්‍රථම මෙම අමාත්‍යංශය වෙත

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister 091-2246159
ලේකම් / செயலாளர் / Secretary 091-2246156 091-2030701
කාර්යාල / காரியாலயம் / Office 091-2030708 පාලන/நிர்வாகம்/Administration 091-2030705 අධ්‍යාපන/கல்வி/Education 091-2030703 /Planning
ෆැක්ස් / பெக்ஸ் / Fax 091-2246157 091-2246156 091-2234044

සෘජුවම ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව ඉදිරිපත් කරනු ලබන හා සෘජුවම සේවක මහත්ම මහත්මීන් විසින් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන කිසිදු අභියාචනයක් සම්බන්ධයෙන් අභියාචනා මණ්ඩලයෙන් සලකා බැලීමට කටයුතු නොකරන බව ද අවධාරණය කරමි.

06. ස්ථාන මාරුවීම් ලබා ඇති කිසිදු සේවක මහත්මයකු හෝ මහත්මියක හෝ නියමිත දිනයෙන් පසුව නිදහස් නොකොට රඳවා ගැනීම නොකළ යුතු අතර, මෙම සේවක මහත්ම මහත්මීන් අභියාචනා ඉදිරිපත් කරන්නේ නම් ඒ සඳහා කාලය ප්‍රමාණවත් වන පරිදි මෙම තීරණ පිළිබඳ එම සේවක මහත්ම මහත්මීන් කඩිනමින් දැනුවත් කිරීම හා නියමිත දිනයේදී නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට හැකි වන පරිදි අදාළ සේවක මහත්ම මහත්මීන් නිදහස් කිරීම ඔබගේ හා පාසලේ විදුහල්පතිගේ වගකීම වන බව ද අවධාරණය කරමි.

07. මෙම ස්ථාන මාරු තීරණ පෙර සඳහන් කළ පරිදි අමාත්‍යාංශ වෙබ් අඩවිය වෙත (edumin.sp.gov.lk) මුදා හැර ඇති බැවින් එම තීරණවල දෘඪ පිටපත් තැපැල් මඟින් යොමු කිරීමක් සිදු නොකරන හෙයින් මේ පිළිබඳව ඔබ කලාපයට අයත් සියලු ආයතන ප්‍රධානීන් වෙත දැන්වීම සිදු කළ යුතු අතර, එම ස්ථාන මාරු තීරණ දුටු බවට තම සේවා ස්ථානයට අයත් එක් එක් සේවක මහත්ම මහත්මීන්ගෙන් අත්සන් ලබා ගෙන ගොනු කර තබා ගත යුතු බවත්, එම අත්සන් ලේඛනයන්හි පිටපත් 2025.07.01 දිනට ප්‍රථම මා වෙත යොමු කිරීම අනිවාර්යය වන බවත් සියලු ආයතන ප්‍රධානීන්/පාසල් විදුහල්පතිවරුන් දැනුවත් කරන ලෙසට ද තවදුරටත් දන්වා සිටිමි.

ඒ.යූ.වේලාරත්න,

ලේකම්

ඒ.යූ. වේලාරත්න
ලේකම්
අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන,
මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය,
දකුණු පළාත.

පිටපත :- සියලුම විදුහල්පතිවරුන් - අ.ක.ස.

ආකෘති අංක :03

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ සේවයේ නියුතු අනධ්‍යයන සේවක සේවයේ වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත් කිරීම**

**අයදුම්පත්‍රය - 2025**

| තනතුර : | පන්තිය හා ශ්‍රේණිය : |
|---|---|

1. සම්පූර්ණ නම : ..........................................................................................................
2. ස්ථාන මාරු ලේඛනයේ සඳහන් නම :......................................................................................
   ..........................................................................................................................
   2.1. හැඳුනුම්පත් අංකය : ..............................................................................................
3. ස්ථිර ලිපිනය : ..........................................................................................................
4. තාවකාලික ලිපිනය : ..................................................................................................
5. දූරකථන අංකය : ......................................................................................................
6. වර්තමාන සේවා ස්ථානය : ..........................................................................................
7. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය : අවු :..........................................................
8. සම්පූර්ණ සේවා කාල සීමාව : අවු ............ මාස :............ දින:............ සිට ............ දක්වා
9. 
   9.1. වාර්ෂික ස්ථාන මාරු යටතේ ස්ථාන මාරු කරන ලද සේවා ස්ථානය : ..........................................
   ..........................................................................................................................
   9.2. ස්ථාන මාරු ලේඛනයේ අනු අංකය : ................................ ස්ථාන මාරු අංකය:..................
   9.3. ඔබ සමඟ ස්ථාන මාරු කරනු ලබන අනුප්‍රාප්තිකයා/අනුප්‍රාප්තිකයාගේ නම :..............................
   ..........................................................................................................................
10. අභියාචනා මඟින් ඉල්ලුම් කරනු ලබන වෙනත් සේවා ස්ථාන : ..................................................
    ..........................................................................................................................
    ..........................................................................................................................
11. අභියාචනා ඉදිරිපත් කිරීමට හේතු : ..........................................................................
    ..........................................................................................................................
    ..........................................................................................................................
    ..........................................................................................................................
12. වෙනත් කරුණු : ..........................................................................................................
    ..........................................................................................................................
    ..........................................................................................................................

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

................................ ................................
දිනය අත්සන

13. නිර්දේශ කරමි/නොකරමි :..........................................................................................
    ..........................................................................................................................

................................ ................................
දිනය විදුහල්පති නිල මුද්‍රාව

14. නිර්දේශ කරමි/නොකරමි :..........................................................................................
    ..........................................................................................................................

................................ ................................
දිනය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ නිල මුද්‍රාව

15. නිර්දේශ කරමි/නොකරමි :..........................................................................................
    ..........................................................................................................................

................................ ................................
දිනය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නිල මුද්‍රාව